# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## දෙවන වාර වැඩ පැවරුම් අංක 05 -2020
## මව්බස

Name / Index No :......................................................  **Grade 3**

**2020.05.05 සිට 2020.05.11 සතිය දක්වා කරවන්න.**

**3 ශ්‍රේණිය සියළුම පන්ති සඳහා දෙවන වාරය**

**2020/05/05 දින සිට 2020/05/12 දින දක්වා මව්බස වැඩ පැවරුම**

**ක්‍රියාකාරකම් සිදු කිරීමේදී දරුවන්ට අවශ්‍ය අවස්ථාවලදී වැඩිහිටියෙකු මගපෙන්වීම් සිදු කරන්න.**

2020.05.05 දිනට

01. මගේ රට ගීතයට කිහිප වරක් සවන් දීමට සළස්වන්න.(පෙළ පොත 10 පිටුව)
02. ගීතයේ ඇතුලත් වචනවල අර්ථය දරුවාට පැහැදිලි කරන්න.
    පහත වචන සඳහා විශේෂ අවධානයක් යොමු කරන්න.

    1) සිරිසැප = හොඳම සැප
    2) පාන්දර = ඉර නැගෙන වෙලාව
    3) ඇළ = ජලය තැනකින් තැනකට ගෙනයාමට සාදපු මාර්ගයක් බව
    4) දොළ = ඉබේ සෑදී ඇති කුඩා ජලය ගලා යන මාර්ගයක් බව
    5) වනමල් = කැළෑ මල්
    6) කවඩි = මුහුදු වෙරලේ ඇති මිය ගිය සත්ත්වයෙකුගේ කොටසක් බව
    7) ගස්බිල් = ගස් බෙන

03. ගීතය ඇසුරින් (වාචික) පිළිතුරු ලබා ගන්න.

    1. පාන්දරින් ඇසෙන්නේ මොනවාද?
    2. ඇළ දොළ ගංගාවල පාවෙන්නේ මොනවාද?
    3. වළාකුළු ගෑවෙන්නේ කොහේද?
    4. හඳපානේ නැළවෙන්නේ මොනවාද?
    5. මෙම ගීතයෙන් කියැවෙන්නේ කුමක් පිළිබඳවද?
    6. උසට උසේ පෙනෙන්නේ මොනවාද?
    7. සුවඳ හමමින් පැසී ඉදෙන්නේ මොනවාද?
    8. පුංචි අපට සිරි සැප දෙන්නේ කුමක්ද?

RICHMOND COLLEGE - GRADE 3 - 2020

**2020.05.06 දිනට**

01. මගේ රට ගීතය ගායනා කිරීමට පවසන්න.

02. පෙරදින විශේෂ අවධානයක් යොමු කරන ලද වචන (ප්‍රශ්න අංක 02 ) කියවීම් පොත බලා 3/4 ප්‍රමාණයට ලිවීමට සලස්වන්න.

03. මගේ රට ගීතය ඇසුරින් පිළිතුරු සපයන්න.

කොටුව තුළ ඇති වචනවලින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැනහි ලියන්න.

1. ඕළු නෙළුම් පිපී වැනෙයි

පිරිලා ..................................................

2. උසට උසේ කඳු ද පෙනේ

.............................................. ද ගෑවේ

3. පිපෙන ..................................... පොකුරු

නැළවෙයි හඳ පානේ

4. වනන්තරේ ගස් බිල්වල

................................................ බේරේ

5. පුංචි අපට සිරි සැප දෙයි

..............................................................

| |
|---|
| සමන් පිච්ච |
| වැව් ගානේ |
| මී පැණි බිඳු |
| සිරි ලංකා දීපේ |
| වලාකුළු |

GRADE 3 - 2020

## 2020.05.07 දිනට

01. මගේ රට ගීතය ඇසුරින් කියවෙන දේ පිළිබඳ චිත්‍රයක් අඳින්න.

02. අඳින ලද එම චිත්‍රය පිළිබඳ සරල වාක්‍ය 3ක් ලියන්න.

03. පෙර දින බලා ලියන ලද වචන අසා ලිවීමට දෙන්න.

## 2020. 05.08 දිනට

01. නොගැළපෙන රෝද පාඩම දරුවාට සවන්දීමට සලස්වන්න.
කතන්දරයේ ඇතුලත් පහත අවස්ථා දරුවාට විශේෂයෙන් ජීවිත අත්දැකීම් වලට සම්බන්ධ කර පැහැදිලි කරන්න.

1) ඇතැම් විට විවිධ හැකියා, දක්ෂතා ඇති යහළුවන් අප අතර සිටින බව
2) ඉවත දමන දෙයින්ද ප්‍රයෝජනයක් ගත හැකි බව
3) එකමුතු බව හා සමගි බව
4) මුලදී උදවු කළ අය අමතක නොකිරීම
5) කළගුණ සැලකීම
6) වැරදි හඳුනාගෙන ඒවා පිළිගැනීම
7) වැරදි අමතක කර සමාව ලබාදීම

02. පහත ප්‍රශ්න සඳහා පාඩම ඇසුරින් පිළිතුරු වාචිකව ලබාගන්න.

1) කතාවේ සඳහන් යාළුවෝ හතරදෙනා කව්ද?
2) පඳුරකින් එළියට පැන්නේ කවුද?
3) එයාගේ නම කුමක්ද?
4) කරත්තයේ හිමිකරු කවුද?
5) කරත්තය තිබුණේ කොහේද?
6) කරත්තය තල්ලු කිරීමට අපහසු වූයේ ඇයි?
7) යහළුවන් ගෙන ආ රෝද වලින් සෑදුවේ කුමක්ද?
   - රෑං රෑං පැංචා
   - ඉඳිකටු මුදියන්සේ
   - බකබක අප්පුහාමි
   - හඬලන රාල

8) පිනුම්හාමිට යාළුවන් ගෙන් ලැබුණු තෑගි මොනවාද?

9) කථාවෙන් ගත හැකි ආදර්ශ මොනවද?

RICHMOND COLLEGE - GRADE 3 - 2020

**2020. 05.11 දිනට**

01. ශබ්දනගා පාඩමෙන් කොටසක් කියවීමට දරුවාටඋපදෙස් දෙන්න.

02. ඇඟිල්ල ගෙන යමින් නිශ්ශබ්දව පාඩම කියවීමට දරුවාට උපදෙස් දෙන්න.

03. පහත සඳහන් වචන කියවීම් පොත බලා 3/4 ප්‍රමාණයට ලිවීමට සලස්වන්න.

1) ඉත්තෑවෙකුයි
2) ගස් කොළන්
3) පාළු
4) පුංචි
5) විශාල
6) යන්තරයක්
7) රෝදය
8) බලයෙන්
9) මෝලක්
10) ළිඳ

2020/05/12

වරහන් තුළින් නිවරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. පිට්ටනියේ තිබුණේ කුමක් ද?
(බයිසිකලයක්/පුංචි කරත්තයක්/ සරුංගලයක්)
2. කරත්තයට සවිකර තිබුණේ
(ගැළපෙන රෝදයි/බයිසිකල් රෝදයි/නොගැලපෙන රෝදයි)
3. අත් කරත්තය සෑදුවේ
(රුං රුං පැංචා/බක බක අප්පුහාමි/ඉදිකටු මුදියන්සේ)
4. හඬලන රාළ පිනුම් හාමිට දුන්නේ
(කැරට් අලයක්/ඇපල් ගෙඩියක්/රස කැවිලි සහ පාන් ගෙඩියක්)
5. මෙම කතාවේ යාළුවෝ හතරදෙනා
(උත්සහවන්ත යි/කම්මැලි යි/ අකීකරු යි)
6. පෙර දින බලා ලියන ලද වචන අසා ලිවීමට දෙන්න.

| | |
|---|---|
| 1 | 2 |
| 3 | 4 |
| 5 | 6 |
| 7 | 8 |
| 9 | 10 |

Richmond College - Grade 3 – 2020